පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

பாராளுமன்றச் செயலாளர் நாயகத்தின் அலுவலகம்
இலங்கைப் பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே.

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

PARLIAMENT SECRETARIAT
Parliament of Sri Lanka, Sri Jayewardenepura Kotte.

සන්නිවේදන දෙපාර්තමේන්තුව
தொடர்பாடல் திணைக்களம்
Department of Communication

දුරකථන අංක / தொலைபேசி இல / Telephone Nos: +94(0)11 2777287, +94(0)11 2777327, +94(0)11 2777100 - 3201/ 6534
ෆැක්ස් / தொலைநகல் / Fax: +94(0)11 2777327
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-Mail: news@parliament.lk, www.parliament.lk


මගේ අංකය / எனது இல / My No: PS/COM/MED/11/PR/25/Jun/S/42

ඔබේ අංකය / உமது இல / Your No:

**2025.05.20**

<u>මාධ්‍ය නිවේදනය</u>

**(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතාගේ ඉල්ලා අස්වීම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් පවතින බව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය මැතිවරණ කොමිෂන් සභාවට දන්වයි.**

ජාතික ජන බලවේගයේ ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය තමා වෙත ලබාදී ඇති බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලිපියක් යොමු කරමින් දන්වා තිබේ.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතාගේ ලිපියට අනුව ඉහත ඉල්ලා අස්වීම 2025 ජූනි 20 වැනිදා සිට බලපැවැත්වෙන බවද මහ ලේකම්වරිය දන්වා තිබේ.

ඒ අනුව, දසවැනි පාර්ලිමේන්තුවේ (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතාගේ අසුන හිස්ව ඇති බව 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙන බවද මහ ලේකම්වරිය මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත දන්වා සිටී.

එම්. ජයලත් පෙරේරා,
අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා / අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩ බලන),
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
0703139114